**ලාහුගල ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ 2015 අගෝස්තු 20 දින ලේකම්වරයාට යවන ලදී.

### 1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ලාහුගල ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
**------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලෙජරයට අනුව සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා වියදම රු.7,569,525 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.7,653,825 ක් විය. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.84,300 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ලෙජරයට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව ගමන් වියදම රු.93,692 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමේ රු.95,612 ක් ලෙස රු.1,920 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජරයට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව සැපයුම් හා උපකරණ වියදම රු.572,442 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට ගෙන තිබුණේ රු.569,416 ක් වශයෙනි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.3,026 ක් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.
**---------------------------------------**

එකතු වටිනාකම රු.52,142,151 ක් වූ ගිණුම් විෂයයන් 7 කට අදාල අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** - 150 (4) වගන්තිය | බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති මාලාව** | |
| (i) රීති 59 - 66 | ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අය කලයුතු ආයතන හඳුනාගෙන ඒවා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) රීති 218 | සභාව සතු රු.50,764,825 ක ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පරීක්ෂාකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 | එකතුව රු.118,301 ක වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එන ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,037,910 ක් වූ අතර, එයට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,142,861 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,180,771 ක පසුබෑමක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ.

(අ) පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කුලී, බලපත්‍ර ගාස්තු සහ සේවා සඳහා ගාස්තු ආදායම් මූලාශ්‍රයන්හි සියයට 27 සිට සියයට 95 දක්වා පරාසයක අඩුවීමක්ද, වෙනත් ආදායම් වල සහ ප්‍රදාන වල සියයට 13 සිට සියයට 55 දක්වා වැඩිවීමක්ද පෙන්නුම් කරයි.

(ආ) පුනරාවර්තන වියදම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා, ගමන් වියදම්, ප්‍රවාහන සම්බන්ධතා, උපයෝගිතා සහ වෙනත් සේවා යන වියදම් වල සියයට 9 සිට සියයට 159 ක වැඩිවීමක්ද, ප්‍රාග්ධන වත්කම් නඩත්තුව සහ ආධාර මුදල් හා සහනාධාර යන වියදම් වල සියයට 17 සිට 74 ක අඩුවීමක්ද පෙන්නුම් කරයි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| බදු කුලී | 350 | 61 | 200 |
| බලපත්‍ර ගාස්තු | 205 | 114 | 26 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 3,001 | 203 | - |
| වෙනත් ආදායම් | 320 | 225 | - |

**2.3.2 වෙළඳ බලපත්‍ර ගාස්තු**

බලපත්‍ර ගාස්තු වශයෙන් රු.26,983 ක් වර්ෂ කිහිපයකට පෙර සිට ලැබිය යුතුව තිබියදී එම මුදල් අයකර ගැනීමට හෝ නෛතික ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**2.3.3 වෙනත් ආදායම්**

සන්නිවේදන කුළුණුවලින් සහ ප්‍රචාරක දැන්වීම්වලින් ආදායම් එකතුකර ගැනීම සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබීම හේතුවෙන් සභාවට ලැබිය යුතුව තිබූ ආදායම් දළ වශයෙන් රු.7,500 ක් සභාවට අහිමිවී තිබුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

(අ) 2014 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ හඳුනාගෙන අයකර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවට අයත් පුස්තකාලයන්හි 2014 දෙසැම්බර් වර්ෂය අවසන් වන විට පොත් 1537 ක් අස්ථානගත වී ඇති අතර, එම පොත් වලින් වටිනාකම හඳුනාගත හැකි පොත් 1,040 ක වටිනාකම රු.94,765 ක් විය. පුස්තකාල පොත් බැහැර දීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොමැති බැවින් වර්ෂයක් පාසාම පොත් අස්ථානගතවීම් වැඩිවීමට හේතුවී තිබුණි.

(ආ) වර්ෂ 10 කට පෙර සිට අපහරණය කිරීමට භාණ්ඩ සමීක්ෂණ කමිටු විසින් නිර්දේශ කර ඇති පොත් 933 ක් අපහරණය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) දැනට සභාවේ පවතින වාහන 20 න් කැබ් රථයක් හැර අනෙකුත් සියළුම වාහන සභාවේ නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු වතුර බවුසරයක් අළුත්වැඩියා කිරීමට 2010 වර්ෂයේ ගරාජයක් වෙත යවා තිබුණු අතර, බවුසරය නැවත සභාවට ලැබී නොතිබුණු අතර, ඒ පිළිබඳව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති අනුව නියමිත ආකෘති පත්‍රය ප්‍රකාරව ආදායම් ලේඛණ පවත්වා නොතිබුණි.

**4. පද්ධති හා පාලන.**

පහත සඳහන් පද්ධති හා පාලන සම්බන්ධ ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** අයවැය පාලනය

**(ඇ)** වත්කම් කළමනාකරණය